# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1510/ 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2023

දිනය / திகதி / Date – 03/12/2023 පැය 1920

**මාධ්‍ය නිවේදනය**

## අන්තර් රථවාහන කොට්ඨාස ක්‍රිකට් තරඟාවලියේ ආරම්භක අවස්ථාවට වැඩ බලන පොලිස්පති සහභාගී වීම.














කොළඹ රථ වාහන හැසිරවීමේ රාජකාරි නිරත නිලධරයන්ගේ සුභදතාවය වර්ධනය කිරීමේ අරමුණින් කොළඹ රථ වාහන කොට්ඨාසය වාර්ෂිකව සංවිධානය කරනු ලබන අන්තර් රථ වාහන කොට්ඨාස ක්‍රිකට් තරඟාවලිය 2023.12.03 වන අද දින කොළඹ 07 පිහිටි එන්.සී.සී. ක්‍රීඩාංගනයේදී ආරම්භ කරන ලදී. එහි සමාරම්භක උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස වැඩ බලන පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා සහභාගී විය.

තරඟාවලිය සඳහා කොළඹ දිසාවේ රථ වාහන අංශ නියෝජනය කරමින් කණ්ඩායම් 26 ක් සහභාගී වන අතර මෙම ආරම්භක අවස්ථාවට මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් නිශාන්ත වීරසිංහ මහතා, ප්‍රවීණ ක්‍රිකට් ක්‍රීඩක අරවින්ද ද සිල්වා මහතා, කොළඹ දිසාවේ රථ වාහන භාර නියෝජ්‍ය පොලිස්පති ප්‍රියන්ත ලියනගේ මහතා, කොළඹ රථ වාහන කොට්ඨාසයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි පුෂ්පකුමාර මහතා ඇතුළු නිලධාරීන් පිරිසක් සහභාගී විය.

එහිදී යතුරුපැදි සොරකමක් සිදුකර පලා ගිය සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගැනීමට කටයුතු කළ වැල්ලවත්ත රථ වාහන අංශයට අනුයුක්තව රාජකාරි කළ පො.සැ 49665 රසික සහ පො.කො 10386 සේනානායක යන නිලධාරීන් හට ඔවුන්ගේ එම යහපත් ක්‍රියාව පැසසුමට ලක් කරමින් වැඩ බලන පොලිස්පතිතුමා විසින් තිළිණ ප්‍රධානයක් ද සිදුකරන ලදී.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**